**ශීර්ෂය 249 - භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 249 - භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූලි 21 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

#### 2.1.1 ආදායම් ඇස්තමේන්තු කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නිරීක්ෂණය<br>-------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>---------------------------- | නිර්දේශය<br>------------- |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව විසින් 2022 වර්ෂය සඳහා ආදායම් සංකේතාංක 11 ක් යටතේ රු.103,400,000,000 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී සියළුම ආදායම් සංකේතාංකවල මූලික ආදායම් ඇස්තමේන්තු සංශෝධනය කර තිබූ අතර මූලික ආදායම් ඇස්තමේන්තුවේ නොතිබුණු 3001.02.00 දරණ ආදායම් සංකේතාංකයට අදාලව සංශෝධිත ඇස්තමේන්තුව යටතේ රු.100,000,000 ක් ඇස්තමේන්තු කර තිබුණි. තවත් ආදායම් සංකේතාංක 7 ක මුළු ආදායම් ඇස්තමේන්තු එකතුව රු.25,310,000,000 කින් අඩු කර තිබුණි. ආදායම් සංකේතාංක 5 ක මුළු ආදායම් ඇස්තමේන්තු එකතුව රු.261,600,000,000 කින් වැඩි කර තිබුණි. 2003.05.00 භාණ්ඩාගාර බැදුම්කර අධිභාරය මුල් ආදායම් ඇස්තමේන්තුවේ සඳහන් රු.14,200,000,000 ක ආදායම රු.8,900,000,000 කින් වැඩි කර ආදායම් ඇස්තමේන්තු සංශෝධනය කර තිබුණි. සමස්තයක් වශයෙන් දෙපාර්තමේන්තුව විසින් මුල් ආදායම් ඇස්තමේන්තුව අනුව රැස්කිරීමට අපේක්ෂා කර තිබූ ආදායම රු.236,290,000,000 කින් වැඩි කර ඇස්තමේන්තුව සංශෝධනය කර තිබුණි.<br><br>කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය අවසන් වන විට ආදායම් සංකේත 12 කින් රු.154,776,282,088 ක ආදායමක් රැස් කර තිබුණි. ඒ අතරින් ආදායම් සංකේත 7 ක මුල් ආදායම් ඇස්තමේන්තු ඉක්මවා ආදායම් රැස්කර තිබුණි. ඒ අනුව ආදායම් ඇස්තමේන්තු කිරීම හා ඒවා සංශෝධනය කිරීම තාත්වික පදනමක් මත සිදු වී නොතිබුණු බව නිරීක්ෂණය විය. | 2022 වර්ෂය තුල රට තුල පැවති ආර්ථික අර්බුදකාරී තත්වය හා රටේ පැවති අස්ථාවරභාවය හේතුවෙන් ආදායම් රැස්කිරීමේ විවිධ අවිනිශ්චිතතා පැන නැගීම මත වාර්ෂික ආදායම් ඇස්තමේන්තු සංශෝධනය කර ඇති අතර, එම ආදායම් සංකේතාංක වල සංශෝධිත ඇස්තමේන්තුවේ සඳහන් ආදායම අපේක්ෂිත ආදායමට වඩා ලැබීම හේතුවෙන් ආදායම වැඩි වී ඇත. එක් එක් ආදායම් ප්‍රභවයේ ස්වභාවය අනුව වර්ෂ ආරම්භයේදී හෝ සමාලෝචිත වර්ෂයේ මුල් මාස 06 තුළ ලැබූ සත්‍ය ආදායම හා ආදායම් එකතු කරනු ලබන ආයතන විසින් ඉදිරිපත් කරනු ලබන සංශෝධිත ආදායම් ඇස්තමේන්තුද පදනම් කරගනිමින් 100% ක් නිවැරදිව පුරෝකථනය කර මූලික / සංශෝධිත ඇස්තමේන්තු සකස් කිරීම ප්‍රායෝගිකව සිදු කල නොහැක. උද්ගතවන තත්වයන් කල්තබා ඇස්තමේන්තු කල නොහැකි මෙවැනි ආදායම් තවත් කාල පරිච්ඡේදයක් හා සැසදීම මගින්ද ඇස්තමේන්තු කිරීම අපහසුය. | මු.රෙ. 85 හි සඳහන් විධිවිධාන සැලකිල්ලට ගෙන නිවැරදි හා තාත්ත්වික ආදායම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව, තත්‍ය ආදායම සමඟ සැසඳීමේදී ආදායම් සංකේතාංක 6 ට අදාළව සියයට 97 ක අඩුවීමේ සිට සියයට 237 ක වැඩිවීම දක්වා පරාසය තුළ වෙනස් වී තිබූ බව නිරීක්ෂණය විය. | විගණන නිරීක්ෂණය හා එකඟ වේ. | මු.රෙ. 85 හි සඳහන් විධිවිධාන සැලකිල්ලට ගෙන නිවැරදි හා තාත්ත්වික ආදායම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. |

### 2.1.2 හිඟ ආදායම් රැස් කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය<br>--------------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>----------------------------------- | නිර්දේශය<br>------------ |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට ආදායම් සංකේතාංක 08 කට අදාළ හිඟ හිටි ආදායම රු.261,543,883,717 ක් වූ අතර ඉන් වසරකට වඩා වැඩි හිඟ හිටි ආදායම රු.2,357,789,706ක් වී තිබුණි. | විගණන නිරීක්ෂණය හා එකඟ වේ. | හිඟ හිටි ආදායම් කාර්යක්ෂමව අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන හිඟ ආදායමට සාපේක්ෂව 2022 දෙසැම්බර් 31 දින වනවිට සමස්ත හිඟ හිටි ආදායම සියයට 57 ක අඩුවීමේ සිට සියයට 18443ක වැඩිවීමක් දක්වා වූ පරාසයක විචලනය වී තිබුණි. ඒ අනුව, | | |
| | (i). ආදායම් සංකේත අංක 20.02.02.99 යටතේ පොළිය - අනෙකුත් ආදායම්වලට අදාළ හිඟහිටි ආදායම 2021 වර්ෂයට සාපේක්ෂව 2022 දෙසැම්බර් 31 දින වන විට සියයට 57 කින් පහළ ගොස් තිබුණි. | විගණන නිරීක්ෂණය හා එකඟ වේ. | හිඟ හිටි ආදායම් කාර්යක්ෂමව අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| | (ii). ආදායම් සංකේත අංක 20.03.99.00 යටතේ - අනෙකුත් ලැබීම්වලට අදාළ හිඟහිටි ආදායම 2021 වර්ෂයට සාපේක්ෂව 2022 දෙසැම්බර් 31 දින වන විට සියයට 247 කින් ඉහළ ගොස් තිබුණි. | විගණන නිරීක්ෂණය හා එකඟ වේ. | හිඟ හිටි ආදායම් කාර්යක්ෂමව අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| | (iii). ආදායම් සංකේත අංක 20.06.04.00 යටතේ ණය ආපසු අයකර ගැනීම්වලට අදාළ හිඟ හිටි ආදායම 2021 වර්ෂයට සාපේක්ෂව 2022 දෙසැම්බර් 31 දින වන විට සියයට 18443 කින් ඉහළ ගොස් තිබුණි. | විගණන නිරීක්ෂණය හා එකඟ වේ. | හිඟ හිටි ආදායම් කාර්යක්ෂමව අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

<table>
<tr>
<td>(ඇ)</td>
<td>2019 හා ඊට පෙර වර්ෂයන්ට අදාල හිඟ හිටි ආදායම සම්බන්ධයෙන් සිදුකළ පරීක්ෂාවේදී ගිවිසුම් ප්‍රකාරව ණය පොළී හා ණය වාරික නොගෙවීම මත ආයතන 3 කට අදාලව රු.2,282,681,252 ක හිඟ හිටි ආදායමක් අයකර ගැනීම පිළිබඳ අවිනිශ්චිතතාවයක් පවතින බව දන්වා තිබුණි.</td>
<td>ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව සහ සර්වෝදය ආර්ථික ව්‍යවසාය සංවර්ධන සේවා (ගැරන්ටි) ලිමිටඩ් යන ආයතන මගින් හිඟ ණය අයකර ගැනීම සිදු කළ ද, එකී හිඟ තවදුරටත් අය කිරීම පිළිබඳව අවිනිශ්චිතභාවයක් පවතී. ඒ අනුව, ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාවට අයත් බදුරලිය හා මාවනැල්ල පිහිටි කර්මාන්තශාලා 02 ක් ඇරෝමා නැචුරල් රබර් පුද්ගලික සමාගමට බදු දී ඇති අතර 2022 වර්ෂයේ සිට එම බදු ආදායම, ණය පියවා ගැනීම වෙනුවෙන් අයකර ගැනීමට කටයුතු කිරීමත්, ඇල්පිටිය ෆෝම් රබර් කර්මාන්තශාලාවේ යන්ත්‍ර සූත්‍ර තක්සේරු කර විකිණීමෙන් ණය පියවා ගැනීමටත්, සණස සංගමය බදුල්ල යන ආයතනයට අදාළ හිඟ ණය හා පොලී මුදල් අයකර ගැනීමට නඩු ගොනු කිරීමට නීතිපති දෙපාර්තමේන්තුව වෙත 2022.04.22 දින දන්වා ඇති බව හා සර්වෝදය ආර්ථික ව්‍යවසාය සංවර්ධන සේවා (ගැරන්ටි) ලිමිටඩ් ආයතනයේ හිඟ ණය ප්‍රතිව්‍යුහගත කිරීමත් සිදු කරන බව වාර්තා කර තිබුණි.</td>
<td>හිඟ හිටි ආදායම් කාර්යක්ෂමව අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම.</td>
</tr>
<tr>
<td>(ඈ)</td>
<td>2022 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ හිඟ ආදායම් ප්‍රකාශයේ තිබූ පසුගිය වර්ෂයට (2021) අදාළ හිඟ මුදල්හි ආරම්භක ශේෂයන් හා 2021 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ ACA1(i) ආකෘතියෙහි දක්වා තිබූ හිඟ ආදායමේ අවසාන ශේෂයන් අතර පහත වෙනස්කම් පැවතුණි.</td>
<td>වෙනස්කම් වලට හේතු පහත පරිදි වේ.
<table>
<tr><th>ආදායම් සංකේතාංකය</th><th>වෙනසට හේතුව</th></tr>
<tr><td>20.02.01.99</td><td>ශ්‍රී ලංකා රේගුව විසින් 2021.12.31 දින දක්වා නොතිබුණු හිඟ ආදායම් රු.180,000 ක් 2022.12.31 දිනට හිඟ ආදායම් වාර්තාවේ දක්වා තිබීම.</td></tr>
</table>
</td>
<td>වර්ෂය අවසානයේදී අදාළ ආදායම් ගණන්දීමේ නිලධාරීන් හිඟ හිටි ආදායම් වාර්තා සන්සන්දනය කර ගත යුතු වීම.</td>
</tr>
</table>

| ආදායම් සංකේතාංකය | 2021 වර්ෂයේ ඒසීඒ-1(i) වාර්තාව අනුව 2021.12.31 දිනට හිඟ ආදායමේ අවසාන ශේෂය | 2022 වර්ෂයේ ඒසීඒ-1(i) වාර්තාව අනුව 2022.01.01 දිනට හිඟ ආදායමේ ශේෂය | වෙනස |
|---|---|---|---|
| | රු. | රු | රු. |
| -------- | ------------ | ---------------- | ----------- |
| 20.02.01.99 | 6,938,319 | 7,118,319 | (180,000) |
| 20.02.02.99 | 22,565,926 | 22,564,779 | 1,147 |
| 20.03.99.00 | 25,310,655 | 71,264,326 | (45,953,671) |
| 20.05.99.00 | - | 62,622,634 | (62,622,634) |

20.02.02.99 නිලධාරියෙකු විශ්‍රාම යෑම හේතුවෙන් මෙම වෙනස ඇතිවූ බව රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය දන්වා ඇති බව.

20.03.99.00 සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් 2021.12.31 දිනට දක්වා නොතිබූ රු. 44,633,775 ක හිඟ මුදලක් 2022.12.31 දිනට ලබා දුන් හිඟ ආදායම් වාර්තාවේ දක්වා තිබීම හා ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ 2021.12.31 දිනට රු.160,703 ක් වැරදීමකින් හිඟ ආදායම් ලෙස සටහන් කර ඇති බව දන්වා ඇත.

20.05.99.00 විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් 2021.12.31 දිනට දක්වා නොතිබූ රු.62,622,634 ක හිඟ මුදලක් 2022.12.31 දිනට ලබා දුන් හිඟ ආදායම් වර්තාවේ දක්වා තිබීම. එම හිඟ මුදල 2022 වර්ෂයේ දී අයකරගෙන ඇත.

(ඉ) 2022 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ හිඟ ආදායම් ප්‍රකාශයේ පසුගිය වසරට පෙර වසර වන විට (2020) අදාළ හිඟ මුදල්හි ආරම්භක ශේෂයන් හා 2021 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ ACA1(i) ආකෘතියෙහි දක්වා තිබූ හිඟ මුදල්හි අවසාන ශේෂයන් අතර පහත වෙනස්කම් පැවතුණි.

හිඟ ආදායම් නොගැලපීමට හේතු පහත පරිදි වේ.

වර්ෂය අවසානයේදී අදාළ ආදායම් ගණන්දීමේ නිලධාරීන් හිඟ හිටි ආදායම් වාර්තා සන්සන්දනය කර ගත යුතු වීම.

| ආදායම් සංකේතාංකය | 2021 වර්ෂයට අදාලව ඒසීඒ-1(i) වාර්තාව අනුව 2020 සහ ඊට පෙර වසරවල හිඟ ආදායම් අවසාන ශේෂය | 2022 වර්ෂයට අදාලව ඒසීඒ-1(i) වාර්තාව අනුව 2021 වසරට පෙරවසර වන විට හිඟ මුදල් ආරම්භක ශේෂය | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| 2002.01.99 | 405 ,000 | 510,000 | (105,000) |
| 2003.02.99 | 805,561 | 1,055,110 | (249,549) |
| 2003.99.00 | - | 27,047,153 | (27,047,153) |

| ආදායම් සංකේතාංකය | වෙනසට හේතුව |
|---|---|
| 20.02.01.99 | ශ්‍රී ලංකා රේගුව විසින් 2021.12.31 දින ලබා දුන් හිඟ ආදායම් වාර්තාවේ දක්වා නොතිබු නමුත් 2022.12.31 දිනට ලබා දුන් හිඟ ආදායම් වර්තාවේ 2020 වසරට අදාලව රු. 105,000 ක හිඟ මුදලක් දක්වා තිබීම |
| 20.03.02.99 | වෙළඳ හා නාවික ලේකම් කාර්යාලයේ හිඟ මුදල්වල විනිමය අනුපාත විචලනය ගැලපීම මෙම වෙනසට හේතුවී ඇත. |
| 20.03.99.00 | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් 2021.12.31 දින ලබා දුන් හිඟ ආදායම් වාර්තාවේ දක්වා නොතිබු නමුත් 2022.12.31 දිනට ලබා දුන් හිඟ ආදායම් වර්තාවේ 2019 සහ 2020 වර්ෂවලට අදාලව රු. 27,047,153 ක හිඟ මුදලක් දක්වා තිබීම. |

## 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන වැය විෂයයන් 07 ක් සඳහා අධි ප්‍රතිපාදන සැලසීම හේතුවෙන් එම ප්‍රතිපාදන වර්ෂය තුළ උපයෝජනය කළ පසු රු.13,140,579 ක ඉතිරියක් පැවති අතර, එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 26 සිට සියයට 80 අතර පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි. | විගණන නිරීක්ෂණ හා එකඟ වේ. | මු.රෙ. 50 ප්‍රකාරව ඇස්තමේන්තු නිවැරදිව හා තාත්විකව පිළියෙල කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මූලික වියදම් ඇස්තමේන්තුව හා සංශෝධිත වියදම් ඇස්තමේන්තුව සැසඳීමේදී වැය විෂයන් 4 කට අදාළව විචලතාවය සියයට 66 ක අඩුවීමේ සිට සියයට 224 ක වැඩිවීම දක්වා පරාසයක් තුළ වෙනස්ව තිබුණි. | විගණන නිරීක්ෂණ හා එකඟ වේ. | මු.රෙ. 50 ප්‍රකාරව ඇස්තමේන්තු නිවැරදිව හා තාත්විකව පිළියෙල කළ යුතු වීම. |

**2.3** තැන්පත් ශේෂයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ ගනුදෙනු කිසිවක් සිදු නොවී පවත්වාගෙන යන, 2022 දෙසැම්බර් 31 දිනට එකතුව රු.34,979,074ක් වූ තැන්පත් ගිණුම් 13 ක් පැවතුනි. මෙම තැන්පත් ගිණුම් විදේශ ප්‍රදාන ලැබීම්වලට අදාළ වන අතර, එකී ශේෂ වසර ගණනාවක් මුළුල්ලේ අක්‍රීයව පැවතුණි. මෙම ප්‍රදාන ඒවා ලබා දී ඇති අදාළ අරමුණට යෙදවීමට කටයුතු කළ යුතු වුවද, එසේ කළ නොහැකි නම් එය මුදල් රෙගුලාසි ප්‍රකාරව රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කළ යුතු වුවත් එසේ කර නොතිබුණි. | තැන්පත් ගිණුමේ ඇති මුදල් නියමිත අරමුණට යෙදවීම පිළිබඳව අධීක්ෂණය කිරීම මෙම දෙපාර්තමේන්තුවේ පාලනයෙන් බැහැර කටයුත්තක් වන අතර ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබන ආයතනය විසින් කරනු ලබන අක්මුදල් ඉල්ලීම් හා අදාල වැය විෂයේ පවතින ප්‍රතිපාදන ප්‍රමාණය පදනම් කරගෙන අක්මුදල් නිදහස් කිරීමේ වගකීම මෙම දෙපාර්තමේන්තුව විසින් ඉටුකරනු ලබයි.<br><br>කෙසේ වුවද, විගණන විමසුමෙහි දක්වා ඇති තැන්පතු සම්බන්ධයෙන් මේ වන විටත් අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබන ආයතන වලට තැන්පතු ශේෂයන් පිළිබඳව දැනුම්දීම් සිදුකර ඇති අතර ඒවාට ලැබෙන ප්‍රතිචාර මත ඉදිරි කටයුතු ඉටුකරනු ලැබේ. | ප්‍රදාන, ඒවා ලබා දී ඇති අරමුණට යෙදවීමට කටයුතු කිරීම හෝ එසේ කළ නොහැකි නම් මු.රෙ. 570 අනුව අවස්ථාවෝචිතව අදාළ ගිණුමට හෝ රාජ්‍ය ආදායමට බැරකළ යුතුය. ඒ සඳහා අදාළ ආයතන දැනුවත් කිරීමට කටයුතු කළ යුතු බව. |

**2.4** බැංකු ගිණුම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මු.රෙ. 387 ප්‍රකාරව කිසිම ආණ්ඩුවේ බැංකු ගිණුමකින් අයිරා ගැනීම තහනම් වුවද, විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ මහජන බැංකු ගිණුම මගින් 2022 මැයි 09 වන දින බැංකු අයිරා පහසුකම් ලබාගෙන ඇති අතර, එදිනට එම ගිණුමේ අයිරා ශේෂය වූ රු.7,727,113,034 ක වටිනාකම | රට තුල උග්‍ර ආර්ථික අර්බුදය ආරම්භ වීමත් සමගම 2022 වර්ෂයේ මැයි මස විශ්‍රාමවැටුප ගෙවීම සඳහා භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ බැංකු ගිණුම් වල ද්‍රවශීලතාවය ප්‍රමාණවත් නොවීම හේතුවෙන්, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ නිල බැංකු ගිණුම වෙත විශ්‍රාම වැටුප් සඳහා නිකුත් කරන ලද අරමුදල් ප්‍රමාණය ප්‍රේෂණය වී නොතිබුනි. විශ්‍රාමිකයින් | මු.රෙ. 387 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | |
|---|---|
| වෙනුවෙන් රු.30,925,253 ක අයිරා පොළියක් ගෙවීමට සිදුවී තිබුණි. | සඳහා නියමිත දිනට විශ්‍රාම වැටුප් ගෙවීම කළ යුතු බැවින් මහජන බැංකුව විසින් එම අවස්ථාවේදී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු නිල බැංකු ගිණුම මගින් විශ්‍රාම වැටුප් ගෙවීමට කටයුතු කිරීමට සිදුවීම නිසා දින කිහිපයක් පමණක් සඳහා වලංගු වන පරිදි අදාල නිල බැංකු ගිණුමේ අයිරාවක් පවත්වාගෙන යාමට සිදුවිය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

**3.1.1 රාජ්‍ය ණය ගිණුම්ගත කිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | --------------------------------- | -------------- |
| (අ) | විදේශ ණය වලට අදාළව මුදල් ප්‍රවාහ කළමනාකරණය හා ණය ගනුදෙනු ගිණුම්ගත කිරීම සඳහා සුදුසු ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දී නොතිබුණි. | විදේශ ණය වලට අදාල මුදල් ප්‍රවාහ ඇස්තමේන්තුන් එලෙසින්ම භාණ්ඩාගාර මුදල් ප්‍රවාහය සඳහා සෘජුවම අදාල කර ගත නොහැක. අයවැය සහනයන් ලෙස ලැබෙන විදේශ ණය (Budgetary supported foreign loans) හැර අනෙකුත් ණය මුදල් ප්‍රවාහයන් අදාල ව්‍යාපෘතියේ නිශ්චිත කාර්යයන් ඉටු කිරීම සඳහා ලබා දෙන බැවින් ඒ සම්බන්ධයෙන් අදාල සංවර්ධන පාර්ශවකරුවන් හා ඇතිකරගත් ගිවිසුම් පරිදි උපලබ්ධිවීම් සිදු වන බව තහවුරු කරමි. | රාජ්‍ය ණය ගැනීම හා ණය සේවා ගිණුම්ගත කිරීම විධිමත් කළ යුතු වීම. |
| (ආ) | විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, 2022 වර්ෂයේ හා 2021 වර්ෂය තුළ හෝ ඊට පෙර උපලබ්ධි වූ නමුත් 2022 වර්ෂය අවසන් වන විටත් ගිණුම්ගත නොකළ විදේශ ණය වල වටිනාකම පිළිවෙලින් රු. මිලියන 10,665.4 ක් හා රු.මිලියන 3.6ක් විය. එසේ වුවද විගණනයේ ගණනය කිරීම් අනුව මෙලෙස ගිණුම්ගත නොකළ විදේශ ණය වල 2022 දෙසැම්බර් 31 දිනට මුළු වටිනාකම රු.මිලියන 11,700.6 ක් වූයෙන් රු. මිලියන 1,031.5 වෙනසක් නිරීක්ෂණය විය. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ මෙන්ම මීට පෙර වර්ෂ වලදී ද උපලබ්ධි වී ඇති නමුත් ගිණුම්ගත | විගණන නිරීක්ෂණය හා එකඟ වේ. | රාජ්‍ය ණය ගැනීම හා ණය සේවා ගිණුම්ගත කිරීම විධිමත් කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | නොකළ ණය වටිනාකම් පැවතීම හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉදිරිපත් කර ඇති විදේශ ණය වටිනාකම නිවැරදි නොවන බව නිරීක්ෂණය විය. ගිණුම්ගත නොකළ විදේශ ණය මුදල් භාවිතා කර කිසියම් වියදමක් දරා තිබේනම් එම වියදම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල අන්තර්ගත නොවී පැවතිය හැකි බව තවදුරටත් නිරීක්ෂණය විය. | | |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේදී භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විගණනයට ඉදිරිපත්කල තොරතුරු අනුව ණය අංක 2001042ට අදාලව යූරෝ 1,057,552 හෙවත් රු.මිලියන 240ක ගිණුම්ගත නොවූ ණය ශේෂ ලෙස ඇතුළත් වී නොතිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂයේ රජයේ මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 30(11) තුල මෙම ණය මුදලේ ආරම්භක ශේෂය යූරෝ 5,644,462ක් ලෙසත් වර්ෂය තුළ කිසිදු උපලබ්ධිවීමක් හෝ නැවත ගෙවීමක් නොමැතිව 2022 දෙසැම්බර් 31 දිනට එම ණය ශේෂය යූරෝ 6,702,014 ලෙසත් දක්වා තිබුණි. | 2001042 අංක දරණ ණය ගිවිසුම යටතේ වන යූරෝ 1,057,552 ක මුදල 2021 වර්ෂය තුල හෝ ඊට පෙර වර්ෂවල උපලබ්ධි වූ ණය මුදලක් නොවන බැවින් 2023.02.17 දිනැති ලිපියෙන් එවන ලද වාර්තාවේ සඳහන් කර නොමැත. | රාජ්‍ය ණය ගැනීම හා ණය සේවා ගිණුම්ගත කිරීම විධිමත් කළ යුතු වීම. |
| (ඈ) | රජයේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙන් මුළුමනින්ම පිටතින් පවත්වාගෙන පැමිණි ණය වර්ග 08කට අදාල රු. මිලියන 518,293ක ණය ශේෂ සමාලෝචිත වර්ෂය තුළදී ගිණුම්ගත කර තිබුණි. මේ පිළිබඳව රජයේ මූල්‍ය ප්‍රකාශනවල කිසිදු හෙළිදරව් කිරීමක් සිදු කර නොතිබුණි. තවද, රජය විසින් ණය ලබාගැනීම ඒකාබද්ධ අරමුදල හරහා ගිණුම්ගත කිරීම සාමාන්‍ය ක්‍රමවේදය වුවද ඉහත දක්වන ලද ණයවර්ග 08 ඒකාබද්ධ අරමුදල හරහා ගිණුම්ගත කිරීමට නොහැකි වී තිබුණ ද මෙම ණය වර්ග 08ට අදාල ණය වාරික ඒකාබද්ධ අරමුදල හරහා ගෙවීම් කර තිබුණි. | අදාල මූල්‍ය වර්ෂය තුල අයවැය හිගය මූල්‍යනය කිරීම සඳහා විසර්ජන පනත යටතේ ණය ගැනීමක් සිදු කර නොමැති බැවින් ඒකාබද්ධ අරමුදල හරහා ගිණුම්ගත කිරීම අවශ්‍ය නොවේ.<br><br>මෙම ණය ගිවිසුම් 08 න් හම්බන්තොට වරාය (2017 සිට) හා නොරොච්චෝල් ගල් අඟුරු විදුලි බලාගාර ව්‍යාපෘති සඳහා ගත් ණය  මුදල් වල වාරික ගෙවීම ඒකාබද්ධ අරමුදල හරහා සිදු කරන ලද අතර මත්තල ගුවන් තොටුපල සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ගන්නා ලද ණය මුදල් සේවාකරණය කරනු ලැබුවේ ගුවන්තොටුපල හා ගුවන් සේවා සමාගම යටතේ බව වාර්තා කරමි. | රාජ්‍ය ණය ගැනීම හා ණය සේවා ගිණුම්ගත කිරීම විධිමත් කළ යුතු වීම. |

(ඉ) පෙර වර්ෂයේදී ණය ගිවිසුම් දෙකක් සඳහා රජයේ මූල්‍ය ප්‍රකාශනවල වෙනස් ණය ව්‍යවහාර මුදල් ඒකක භාවිතා කිරීම හේතුවෙන් අදාල ණය ශේෂයන් රු.මිලියන 340 හා රු.මිලියන 285කින් CS-DRMS පද්ධතියේ 854-1 වාර්තාවට අනුව වෙනස්වී තිබුණි. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය තුළදී එම ණයවර්ග දෙකට අදාලව ආරම්භක ශේෂ වල ණය ව්‍යවහාර මුදල් ඒකක වර්ගය පමණක් වෙනස් කර තිබුණද ආරම්භක ශේෂයන් නිවැරදි කර නොතිබුණි. ඒ අනුව ණය මුදලේ ආරම්භක ශේෂයේ වෙනස සමාලෝචිත වර්ෂය තුළ හටගත් විනිමය අලාභය තුළට අවශෝෂණය කර තිබුණි. එම ණය ශේෂ දෙකට අදාලව රජයේ මූල්‍ය ප්‍රකාශන හා CS-DRMS පද්ධතියේ 854-1 වාර්තා අනුව, විනිමය අලාභයන් අතර ඉහත දක්වන ලද වටිනාකමට සමාන වෙනස්කම් නිරීක්ෂණය විය.

අදාල ණය ගිවිසුම් දෙකට අදාලව 2021 දෙසැම්බර් 31 දිනට නිවැරදි ණය ශේෂය, ණය ව්‍යවහාර මුදලින් (Loan Currancy) මූල්‍ය ප්‍රකාශන වල සඳහන් කර ඇත. 2022 දෙසැම්බර් 31 දිනට අදාලව නිවැරදි විනිමය අනුපාත යොදාගෙන එදිනට පැවති අදාල ණය වගකීම ශ්‍රී ලංකා මුදලින් නිවැරදිව සටහන් කර ඇත.

රාජ්‍ය ණය ගැනීම හා ණය සේවා ගිණුම්ගත කිරීම විධිමත් කළ යුතු වීම.

(ඊ) ණය අංක 2021008 හා 2021016 සඳහා 2021 වර්ෂයේදී ලබාගත් CS-DRMS පද්ධතියේ 854-1 වාර්තාව අනුව 2021 දෙසැම්බර් 31 දිනට ශේෂයන් සටහන් වී නොතිබුණ නමුත් 2022 දෙසැම්බර් 31 දිනට ලබාගත් එම වාර්තා තුළ 2022 ජනවාරි 01 දිනට පහත පරිදි ආරම්භක ශේෂයන් නිරීක්ෂණය විය.

| ණය අංකය | ණය මුදල් වර්ගය | ණය මුදල | වටිනාකම රු. |
|---|---|---|---|
| 2021008 | USD | 392,385 | 78,647,303 |
| 2021016 | USD | 12,500 | 2,505,423 |

එසේම රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2022 ජනවාරි 01 දිනට ඉහත ණයවර්ග දෙක සඳහා ආරම්භක ශේෂයන් නොතිබුණ අතර සමාලෝචිත වර්ෂය තුළදී උපලබ්ධිවීම් ලෙස පහත දක්වා ඇති වටිනාකම් ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව මෙම ණය ලබා ගැනීම් කුමන වර්ෂයේ උපලබ්ධිවීම් ද යන්න පැහැදිලි නොවිය.

මෙම ණය ගිවිසුම් දෙක සම්බන්ධයෙන් උපලබ්ධි වීම් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් මෙම දෙපාර්තමේන්තුවට 2022 වර්ෂයේ දන්වා ඇති අතර ඒ අනුව 2022 දෙසැම්බර් මස ගිණුම් සාරාංශ මගින් ගිණුම් ගත කර ඇත.

රාජ්‍ය ණය ගැනීම හා ණය සේවා ගිණුම්ගත කිරීම විධිමත් කළ යුතු වීම.

| ණය අංකය | ණය මුදල් වර්ගය | උපලබ්ධිවූ ණය මුදල් ප්‍රමාණය | වටිනාකම රු. |
| --- | --- | --- | --- |
| 2021008 | USD | 392,385 | 78,280,893 |
| 2021016 | USD | 472,500 | 168,106,589 |

| | | | |
| --- | --- | --- | --- |
| (උ) | ණය අංක 2002054 අදාලව 2022 ජනවාරි 01 දිනට ණය ශේෂය යූරෝ 11 හෙවත් රු.2,495 පමණක් වූ අතර මෙම ණය මුදලට අදාළව සමාලෝචිත වර්ෂය තුලදී කිසිදු ණය උපලබ්ධිවීමක් නොමැතිව 2022 දෙසැම්බර් 31 දිනට අදාල ණය ශේෂය යූරෝ 4,373ක් හෙවත් රු.1,692,045 ක් වී පැවතුණි. | එකඟ වේ. | රාජ්‍ය ණය ගැනීම හා ණය සේවා ගිණුම්ගත කිරීම විධිමත් කළ යුතු වීම. |
| (ඌ) | ණය ගිවිසුම් දෙකක් සම්බන්ධයෙන් දෝෂ සහිත විදේශ විනිමය හුවමාරු අනුපාත භාවිතා කිරීම හේතුවෙන් CS-DRMS පද්ධතියේ 854-1 වාර්තාවට වඩා මූලා‍ය ප්‍රකාශන වල එම ණය වර්ග දෙකට අදාලව එකතුව රු.4,820,798ක් වැඩියෙන් දක්වා තිබුණි. | එකඟ වේ. ණය ගිවිසුම් 02 කට අදාලව විනිමය අනුපාතය රු. 483.2413 වෙනුවට රු.484.2413 මූලා‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වැරදීමකින් යොදාගෙන ඇත. 2023 දි නිවැරදි කිරීමට සටහන් කර ගෙන ඇත. | රාජ්‍ය ණය ගැනීම හා ණය සේවා ගිණුම්ගත කිරීම විධිමත් කළ යුතු වීම. |
| (එ) | ණය ගිවිසුම් දෙකක් සම්බන්ධයෙන් එකතුව රු.1,803,456 සෘන ණය ශේෂයන් රජයේ මූලා‍ය ප්‍රකාශන වල සහ CS-DRMS පද්ධතියේ 854-1 වාර්තාවෙහි නිරීක්ෂණය විය. | එකඟ වේ. | රාජ්‍ය ණය ගැනීම හා ණය සේවා ගිණුම්ගත කිරීම විධිමත් කළ යුතු වීම. |
| (ඒ) | ණය ගිවිසුම් හතරක් සම්බන්ධයෙන් එකතුව රු.652,634,243 ක සෘන ණය උපලබ්ධිවීම් රජයේ මූලා‍ය ප්‍රකාශන වල සහ CS-DRMS පද්ධතියේ 854-1 වාර්තාවේ දක්වා තිබුණු අතර ණය ගිවිසුම් දෙකක් සම්බන්ධයෙන් එකතුව රු.154,795,691 ක සෘන ණය උපලබ්ධිවීම් රජයේ මූලා‍ය ප්‍රකාශනවල පමණක් නිරීක්ෂණය විය. | එකඟ වේ. ව්‍යාපෘති අවසන් වීම හේතුවෙන් ණය ප්‍රදායක විසින් ප්‍රේෂණය කරන ලද මුදලින් වියදම් නොකර ඉතිරි වී ඇති මුදල් ආපසු යැවීම හේතුවෙන් මෙම සෘන ණය උපලබ්ධිවීම් ඇති වී ඇත. | රාජ්‍ය ණය ගැනීම හා ණය සේවා ගිණුම්ගත කිරීම විධිමත් කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඔ) | ණය ගිවිසුම් දෙකකට අදාලව එකතුව රු.24,945,542 ක සෘන ණය උපලබ්ධිවීම් රජයේ මූල්‍ය ප්‍රකාශන වල පමණක් නිරීක්ෂණය වූ අතර එම ශේෂයන්ට අදාලව CS-DRMS පද්ධතියේ 854-1 වාර්තාවේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂයන් (පෙර වර්ෂයේ අවසාන ශේෂයන්) සහ 2022 ජනවාරි 01 දිනට ශේෂයන් (සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයන්) අතර වෙනස්කම් ද නිරීක්ෂණය විය. | එකඟ වේ. ව්‍යාපෘති අවසන් වීම හේතුවෙන් ණය ප්‍රදායක විසින් ප්‍රේෂණය කරන ලද මුදලින් වියදම් නොකර ඉතිරි වී ඇති මුදල් ආපසු යැවීම හේතුවෙන් මෙම සෘන ණය උපලබ්ධිවීම් ඇති වී ඇත. | රාජ්‍ය ණය ගැනීම හා ණය සේවා ගිණුම්ගත කිරීම විධිමත් කළ යුතු වීම. |

### 3.1.2 විදේශ ප්‍රදාන

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | ------------------------------- | -------------- |
| (අ) | 2022 වර්ෂයේ රජයේ මූල්‍ය ප්‍රකාශනවල විදේශ ප්‍රදාන (මුදලින් ලැබීම්) යටතේ සමාලෝචිත වර්ෂය තුළ ලද විදේශ ප්‍රදාන වියදමේ එකතුව රු.මිලියන 3,218 ක් ලෙස දක්වා තිබුණු අතර අදාළ තැන්පතු ලෙජර් අනුව එම වියදමේ එකතුව රු. මිලියන 3,190 ක් විය. මෙම වෙනස තුළ එකතුව රු.මිලියන 27.7 ක් වූ විදේශ ප්‍රදාන, අදාළ අරමුණට නොයොදවා සමාලෝචිත වර්ෂය තුළ රාජ්‍ය ආදායමට බැර කර තිබුණි. | ප්‍රදාන වශයෙන් ලැබු මුදල් ලැබු නිශ්චිත අරමුණට යෙදවීමෙන් අනතුරුව යම් මුදලක් තවදුරටත් ඉතිරිවේ නම්, එම මුදල ප්‍රදානකරුට ආපසු යැවීම හෝ රජයේ ආදායමට බැර කිරීම සිදු කළ යුතු වේ. එලෙස ප්‍රදානකරු වෙත ආපසු යැවීම අවශ්‍ය නොවන අවස්ථාවලදී ඉතිරි වූ මුදල රජයේ ආදායමට බැරකිරීම මෙහිදී සිදු කල යුතුවේ. මෙහි දී ලෝක ආහාර වැඩසටහන යටතේ ලද රුපියල් මිලියන 2.7 ක මුදල රාජ්‍ය ආදායමට බැරකර ඇත්තේ අදාල ප්‍රදාන ආයතනයෙන් මුදල් ලැබීමට පෙර රජයේ අරමුදල් වලින් වියදම් කර තිබු බැවිනි. මෙහි ඇතුලත් රු.මිලියන 24.9 ක මුදල තාක්ෂණ ප්‍රදානයට අදාල ප්‍රසම්පාදන කාර්යය නියමිත කාලය තුළ සිදු නොකිරීම නිසා සැපයුම්කරුවන්ගෙන් අය කරන ලද ප්‍රමාද ගාස්තුවකි. | ප්‍රදායකයන්ගේ විශ්වාසයද තහවුරු වන පරිදි ලැබුණු විදේශ ප්‍රදාන අදාළ අරමුණුවලට යෙදවීම පිළිබඳ සම්බන්ධීකරණය හා නියාමනය ශක්තිමත් කිරීම. |
| (ආ) | 2022 ජනවාරි 01 දිනවන විටත් ශ්‍රී ලංකා රජය වෙත විදේශ ප්‍රදාන ලෙස ලැබී ඇති නමුත් 2022 දෙසැම්බර් 31 දින වනවිටත් අදාල අරමුණට නොයොදවා අක්‍රීයව පැවති විදේශ ප්‍රදාන වටිනාකම රු. මිලියන 57.4 ක් විය. | විදේශ ප්‍රදාන ලෙස ලැබෙන මුදල් අදාල අරමුණට එසේ නොමැති නම් අදාල ව්‍යාපෘතියට උපයෝජනය කරන්නේද යන්න සොයා බැලීම, මෙම දෙපාර්තමේන්තුවේ විෂය පථයෙන් පරිබාහිර කටයුත්තක් වන අතර ඒ | ප්‍රදායකයන්ගේ විශ්වාසයද තහවුරු වන පරිදි ලැබුණු විදේශ ප්‍රදාන අදාළ අරමුණුවලට |

| | | | |
|---|---|---|---|
| | | සම්බන්ධයෙන් සෘජුවම කටයුතු කරනුයේ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසිනි. කෙසේ වුවද අදාල තැන්පත් ගිණුම් වල ඉතිරිව පවතින මුදල් ශේෂයන් අදාල ව්‍යාපෘතිය සඳහා භාවිතා කරන ලෙසටත්, එසේ නොකරන්නේ නම් ආදායමට බැර කිරීමට අවශ්‍ය කටයුතු සලසන ලෙසටත්, වරින්වර අදාල ක්‍රියාත්මක කිරීමේ ආයතන (Implementing Agencies) වෙත ලිපි මඟින් දැනුවත් කර ඇත. | යෙදවීම පිළිබඳ සම්බන්ධීකරණය හා නියාමනය ශක්තිමත් කිරීම. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ ප්‍රදායකයන් 04 දෙනෙකුගෙන් ව්‍යාපෘති 05 කට අදාළව ලැබී තිබූ නමුත් අදාළ අරමුණට නොයොදවා එකතුව රු.34,740,561 ක් වූ විදේශ ප්‍රදාන ආපසු ප්‍රදායක වෙත යවා තිබුණි. | අදාල ව්‍යාපෘතිය සඳහා ලැබු මුදල් නියමිත අරමුණ සඳහා උපයෝජනය කිරීමෙන් අනතුරුව තවදුරටත් යම් මුදලක් ඉතිරිවේ නම් හා එම ඉතිරි මුදල් ප්‍රදානකරු විසින් ඉල්ලා සිටින ලබන්නේ නම් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ එකඟතාවය හා අදාල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලබන ආයතනයේ ඉල්ලීම පරිදි ප්‍රදායක ආයතනය වෙත ආපසු යැවීම අනිවාර්යයෙන්ම සිදු කළ යුතු වේ. | ලැබුණු විදේශ ප්‍රදාන උපරිම ලෙස උපයෝජනය කළ යුතු වීම. |

### 3.1.3 උපණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ----------------------------- | -------------------- |
| (අ) | අදාළ ආයතන සම්බන්ධයෙන් වූ උපණය ගිවිසුම් ප්‍රකාරව ණය ආපසු නොගෙවීම හේතුවෙන් උපණය ගිවිසුම් 5 කට අදාළව ආයතන 4 කින් 2022 දෙසැම්බර් 31 දිනට අය විය යුතු උපණය වාරිකවල එකතු වටිනාකම රු.මිලියන 260,503 ක් විය. ඉන් රු.මිලියන 778 ක එකතු වාරික වටිනාකම වසර 5 කට වඩා වැඩි කාලයක සිට පැවත එන ශේෂයකි. | උප ණය ගිවිසුම් ප්‍රකාරව ණය නොගෙවීම හේතුවෙන් උප ණය ගිවිසුම් 5 කට අදාලව ආයතන 4ක් විසින් 2022 දෙසැම්බර් 31 දිනට අය විය යුතු උප ණය වාරිකවල එකතු වටිනාකම රු. මිලියන 260,503 කි. | රාජ්‍ය උපණය ලබා දීම, අයකර ගැනීම හා උපණය සේවා ගිණුම්ගත කිරීම විධිමත් කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2022 දෙසැම්බර් 31 දිනට උපණය වෙනුවෙන් ලැබිය යුතු පොළී වටිනාකම රු.මිලියන 912 ක් වූ අතර, ආයතන 3 ක් අදාළ ගිවිසුම ප්‍රකාරව මහා භාණ්ඩාගාරය වෙත 2022 වර්ෂයට අදාළව කිසිඳු පොළී මුදලක් ගෙවා නොතිබුණු අතර, ඉන් වසර 5 කට වඩා වැඩි නොගෙවූ පොළී වටිනාකමේ එකතුව රු.මිලියන 616 ක් විය. | 2022.12.31 දිනට උප ණය වෙනුවෙන් තවදුරටත් ලැබිය යුතු පොළී වටිනාකම රු.මිලියන 912 කි. | රාජ්‍ය උපණය ලබා දීම, අයකර ගැනීම හා උපණය සේවා ගිණුම්ගත කිරීම විධිමත් කළ යුතු වීම. |
| (ඇ) | 2022 වර්ෂය තුළදී රු.මිලියන 318,061 ක එකතු උපණය ශේෂයක් ලබාදී තිබූ අතර ඉන් රු.මිලියන 285,191ක උපණය ශේෂයක් ආයතන 06ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී නව උපණය ශේෂයන් ලෙස ලබාදී තිබුණි. මෙම උපණය වටිනාකම සමාලෝචිත වර්ෂයේ ලබාදුන් සමස්ථ වටිනාකමින් සියයට 90 ක් වී තිබුණි. | 2022 වර්ෂයේ දී නව උප ණය ශේෂයන් ලෙස ආයතන 06 කට අදාලව රු.මිලියන 285,191 ක් විය. | රාජ්‍ය උපණය ලබා දීම, අයකර ගැනීම හා උපණය සේවා ගිණුම්ගත කිරීම විධිමත් කළ යුතු වීම. |

**3.1.4 භාණ්ඩාගාර ඇපකර හා සහන ලිපි**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 අංක 12 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) (සංශෝධිත) පනත ප්‍රකාරව, ඇපකර නිකුත්කිරීමේ සීමාව පෙර මූල්‍ය වර්ෂ දෙක සමඟ සමාලෝචිත මූල්‍ය වර්ෂය සඳහා දළ දේශීය නිෂ්පාදිතයේ සමස්තයේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 15 කි. ඒ අනුව 2022 වර්ෂයට අදාළව රු.මිලියන 2,826,300 ක සීමාව තුළ ඇපකර නිකුත් කළ යුතු වුවත් රු. මිලියන 2,908,515 ක් දක්වා ඇපකර නිකුත් කිරීමට කටයුතු කර තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 82,214 ක භාණ්ඩාගාර ඇපකර සීමාව ඉක්මවා නිකුත් කර තිබුණි. | 2022 මාර්තු මස මුල භාගයේ සිට ශ්‍රී ලංකාවේ ඇති වූ ආර්ථික අවපාතය හේතුවෙන් විනිමය අනුපාතිකය අසාමාන්‍ය ලෙස වැඩිවීම කරණ කොට ගෙන ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල සියයට 80 කින් පමණ අවප්‍රමාණය වීම නිසා යථෝක්ත භාණ්ඩාගාර ඇපකර සීමාව 2022.12.31 දින වන විට එහි උපරිම සීමාව ඉක්මවන ලදි. 2003 අංක 03 දරණ මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත හා එහි පසුකාලීන සංශෝධන යටතේ, 2022 වසරේදී භාණ්ඩාගාර ඇපකර නිකුත් කිරීමේදී රාජ්‍ය මූල්‍ය රීතියෙන් අපගමනය වීම හේතුවෙන් ඒ සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවට 2023.02.20 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර ඒ සම්බන්ධයෙන් ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳ එම දෙපාර්තමේන්තුව මේ වන විට කටයුතු කරමින් පවතී. | 2021 අංක 12 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) (සංශෝධිත) පනත ප්‍රකාරව, ඇපකර භාණ්ඩාගාර නිකුත් කිරීමේ සීමාව පිළිපැදිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2022 දෙසැම්බර් 31 දින වන විට බාහිර ආයතන වෙත අවස්ථා 239 ක් යටතේ රු.මිලියන 2,793,987 ක භාණ්ඩාගාර ඇපකර හා අවස්ථා 19 ක් යටතේ රු.මිලියන 114,527 ක සහන ලිපි නිකුත් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, බාහිර ආයතන වෙත අවස්ථා 09 ක දී නිකුත්කළ රු.මිලියන 45,628 ක් වටිනා භාණ්ඩාගාර ඇපකර සහ අවස්ථා 13ක දී නිකුත්කළ රු.මිලියන 66,637 ක් වටිනා සහන ලිපි 2022 දෙසැම්බර් 31 දින වන විට කල් ඉකුත් වී ඇති බව නිරීක්ෂණය විය. | විගණන නිරීක්ෂණය නිවැරදි වේ. | බැංකු ඇපකර හා සහන ලිපි නිකුත් කිරීමේ ක්‍රියාවලිය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා ගතයුතු වීම. |

## 4. මානව සම්පත් කළමනාකරණය

### 4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්ය මණ්ඩලය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------ | ---------------------------- | -------------------- |
| 2022 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ තනතුරු 07 ක් ද, ද්විතීයික මට්ටමේ නිලධාරී තනතුරු 08 ක් ද හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 07 ක් වශයෙන් තනතුරු 22ක් පුරප්පාඩුව පැවතුණි. | 2022.12.31 දිනට තනතුරු 22 ක පුරප්පාඩු පැවතුනි. | දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටු කිරීමට අත්‍යාවශ්‍ය තනතුරු පුරප්පාඩු පිරවීමටත්, අනවශ්‍ය තනතුරු වේ නම් ඒවා සංශෝධනය කර ගැනීමටත් කටයුතු කළ යුතු වීම. |